කැළණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014/15

2020 - අගෝස්තු

**BCOM E 3045** - ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි : (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව සැම විටම ආර්ථික විද්‍යාව හා බැඳී පවතී. ලෝකයේ සිදුවන ආර්ථික සංසිද්ධීන් නිවැරදිව තේරුම් ගැනීමට සහ තීරණවලට එළඹීමට ආර්ථික විද්‍යාව මග පෙන්වනු ලැබේ.

අ. ජාත්‍යන්තර ආර්ථිකය විද්‍යාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. අභ්‍යන්තර වෙළෙඳාම සහ ජාත්‍යන්තර වෙළඳාම අතර වෙනස කුමක්ද ?

(ලකුණු 06)

ඇ. ලෝකයේ බොහෝ රටවල ජාත්‍යන්තර වෙළඳාම දළ දේශීය නිෂ්පාදිතයෙන් සැලකිය යුතු කොටසක් නියෝජනය කරයි. දළ දේශීය නිෂ්පාදිතය සම්බන්ධයෙන් මෑතකාලීන සංඛ්‍යා උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව විමසීමක් සිදු කරන්න .

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 02

ජාත්‍යන්තර වෙළඳාමේ එන පහත සඳහන් වෙළඳ න්‍යායන් ප්‍රචලිත වූ අවධිය ප්‍රචලිතකිරීම සඳහා දායක වූ ආර්ථික විද්‍යාඥයින් සහ ඒවායෙහි අන්තර්ගතය ජාත්‍යන්තර ආර්ථික විද්‍යාවේ උන්නතිය සඳහා කෙසේ හේතු වී දැයි විමසන්න.

අ. නිරපේක්ෂ වාසි න්‍යාය

ආ. සාපේක්ෂ වාසි න්‍යාය

(ලකුණු 10 x 02 =මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

අ. ආර්ථික ගෝලීයකරණය යනු කුමක්ද ?

(ලකුණු 05)

ආ. ගෝලීයකරණයේ ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධ වී ඇති ආකාරය පැහැදිලි කරන්න

(ලකුණු 07)

ඇ. ගෝලීයකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැනට ලබා ඇති කලාපීය ශ්‍රේණිගත කිරීම පිළිබඳව හැඳින්වීමක් කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. ගෙවුම් ශේෂය හිඟයක් ඇතිවීම රටක ආර්ථික ස්ථාවරත්වයක් ඇති වීම සඳහා සෘජුවම බලපානු ලැබේ. මෙම ප්‍රකාශය විමසන්න

(ලකුණු 05)

ආ. ගෙවුම් ශේෂ හිඟය පියවීම සඳහා මහ බැංකුව මැදිහත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න

(ලකුණු 07)

ඇ. ගෙවුම් ශේෂය හා සම්බන්ධ පහත සඳහන් පද පැහැදිලි කරන්න

i. ප්‍රාග්ධන ගිණුම
ii. සමස්ත ශේෂය

(ලකුණු 04 x 02 =08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. විදේශ විනිමය වෙළෙඳ පොළ තුළ ගනුදෙනු කරන ප්‍රධාන පාර්ශවයන් කවරේද?

(ලකුණු 05

ආ. විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම කෙරෙහි බලපාන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 05)

ඇ. විවිධ විනිමය අනුපාත වර්ග මොනවද?

(ලකුණු 05)

ඉ. පාවෙන විනිමය අනුපාතය ආර්ථික සංවර්ධනය කෙරෙහි කෙසේ බලපානු ලබන්නේ ද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 06

අ. වෙළඳ ගිවිසුමක් යනු කුමක්ද

(ලකුණු 04)

ආ. වෙළඳ ගිවිසුමක් ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය සඳහා උපකාරී වන්නේ කෙසේද

(ලකුණු 04)

ඇ. වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගැනීමෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රධාන කාරණ මොනවාදැයි පැහැදිලි කරන්න

(ලකුණු 04)

ඉ. වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීමෙන් වාසි මෙන්ම අවාසිද ඇතිවිය හැකිය. වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමෙන් රටවල් වලට ඇතිවන අවාසි දායක ප්‍රතිඵල මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)